# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

8

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## මුදල් පොත හා සුළු මුදල් පොත

(1) අත්පිට විකුණුම් රු. 10 000 සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වනුයේ පිළිවෙළින්,

(1) මුදල් පොත හා ලදුපතයි
(2) ලදුපත හා මුදල් පොතයි
(3) මුදල් පොත හා ගෙවීම් වවුචරයයි
(4) විකුණුම් ජර්නලය හා මුදල් පොතයි

(2) රු. 50 000 ක ස්ථාවර වත්කම් මිලට ගැනීම සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වනුයේ පිළිවෙළින්,

(1) මුදල් පොත හා ලදුපතයි
(2) ලදුපත හා මුදල් පොතයි
(3) ගෙවීම් වවුචරය හා මුදල් පොතයි
(4) ජර්නල වවුචරය හා පොදු ජර්නලය

(3) මුදල් පොත මගින් ඉටුකරනු ලබන ද්විත්ව කාර්යය වනුයේ,

(1) ලෙජර ගිණුමක හා මූලාශ්‍ර ලේඛනයක කාර්ය
(2) මූලික සටහන් පොතක හා මූලාශ්‍ර ලේඛනයක කාර්ය
(3) ලෙජර ගිණුමක හා මූලික සටහන් පොතක කාර්ය
(4) මූල්‍ය ප්‍රකාශනයක හා මූලාශ්‍ර ලේඛනයක කාර්ය

(4) මුදල් පොතෙහි ගනුදෙනු සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන් රීතිය වන්නේ,

(1) වත්කම් වැඩිවීම හර හා වත්කම් අඩුවීම බැර
(2) වත්කම් අඩුවීම හර හා වත්කම් වැඩිවීම බැර
(3) හිමිකම වැඩිවීම හර හා හිමිකම අඩුවීම බැර
(4) හිමිකම අඩුවීම හර හා හිමිකම වැඩිවීම බැර

(5) රු. 10 000 ක ලී බඩු අළුත්වැඩියා වියදමක් දැරීම යන ගනුදෙනුව හර විය යුතු ගිණුම හා බැර විය යුතු ගිණුම පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මුදල් පොත හර ලීබඩු අළුත්වැඩියා ගිණුම බැර
(2) ලී බඩු ගිණුම හර මුදල් පොත බැර
(3) ලී බඩු අළුත්වැඩියා ගිණුම හර මුදල් පොත බැර
(4) මුදල් පොත හර ලී බඩු ගිණුම බැර

(6) ගිණුමක් තුලනය කිරීම අවශ්‍ය වන්නේ,

(1) ගිණුමේ හර සටහන්හි එකතුව ලබා ගැනීම සඳහා
(2) ගිණුමේ බැර සටහන්හි එකතුව ලබා ගැනීම සඳහා
(3) ගිණුමක ශේෂය හඳුනා ගැනීම සඳහා
(4) නිවැරදි ද්විත්ව සටහන් රීතිය අනුගමනය කර තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා

(7) භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කරන අඩු කිරීම,

(1) දිරි දීමනාවකි
(2) වෙළෙඳ වට්ටමකි
(3) මුදල් වට්ටමකි
(4) පරිත්‍යාගයකි

(8) වෙළෙඳ වට්ටමක්,

(1) ගිණුම්වල සටහන් කරනු නොලැබේ.
(2) ගිණුම්වල සටහන් කරනු ලැබේ.
(3) විකුණුම් ගිණුමේ සටහන් කරනු ලැබේ.
(4) ගැණුම් ගිණුමේ සටහන් කරනු ලැබේ.

(9) මුදල් වට්ටම් දක්නට ලැබෙන්නේ,

(1) ණයගැතියන්ගෙන් මුදල් ලැබෙන අවස්ථාවලදී පමණි.
(2) ණයහිමියන්ට මුදල් ගෙවන අවස්ථාවලදී පමණි.
(3) අත්පිට මුදලට ගනුදෙනු සිදු කරන අවස්ථාවලදී පමණි.
(4) ණයගැති මුදල් ලැබීම් හා ණයහිමි මුදල් ගෙවීම් අවස්ථාවලදී පමණි.

(10) ලද වට්ටම්, ලද වට්ටම් ගිණුමට බැර කරන්නේ,

(1) ආදායම් වැඩිවීම බැර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(2) වියදම් අඩුවීම බැර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(3) වගකීම් වැඩිවීම බැර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(4) හිමිකම් වැඩිවීම බැර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.

(11) දුන් වට්ටම්, දුන් වට්ටම් ගිණුමට හර කරනු ලබන්නේ,

(1) ආදායම් අඩුවීම හර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(2) වියදම් වැඩිවීම හර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(3) වගකීම අඩුවීම හර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.
(4) හිමිකම් අඩුවීම හර යන ද්විත්ව සටහන් රීතියට අනුවය.

(12) මුදල් පොතේ දක්නට ලැබෙන වට්ටම් තීරු මගින් ඉටු වන්නේ,

(1) ගිණුමක කාර්ය පමණි.
(2) මූලික සටහන් පොතක කාර්ය පමණි.
(3) ගිණුමකින් හා උපයෝගී පොතකින් ඉටුවන ද්විත්ව කාර්යයකි.
(4) ඉහත කිසිවක් ඉටු නොවේ.


වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

(13) දුන් වට්ටම්වලට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) දුන් වට්ටම් ගිණුම හර, ණයගැති ගිණුම බැර
(2) ණයගැති ගිණුම හර, දුන් වට්ටම් ගිණුම බැර
(3) මුදල් පොත හර, දුන් වට්ටම් ගිණුම බැර
(4) දුන් වට්ටම් ගිණුම හර, මුදල් පොත බැර

(14) ලද වට්ටම්වලට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ලද වට්ටම් ගිණුම හර, ණයහිමි ගිණුම බැර
(2) ණයහිමි ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර
(3) ලද වට්ටම් ගිණුම හර, මුදල් පොත බැර
(4) මුදල් පොත හර, ලද වට්ටම් ගිණුම බැර

❖ සියරට සළුපිළි ව්‍යාපාරය විසින් රු. 80 000 ක් වටිනා රෙදි තොගයක් "වින්ඩ් ටෙක්ස්ටයිල්" ආයතනය වෙත ණයට විකුණන ලද අතර, ඒ සඳහා නිකුත් කල ඉන්වොයිසියෙන් මාස 3 ක් ඇතුලත ණය බේරුම් කරන්නේ නම් 10 % ක වට්ටමක් ලබාදෙන බවට කොන්දේසියක් දක්නට ලැබුණි. වින්ඩ් ටෙක්ස්ටයිල් විසින් මාස 2 ක් පිරුණු දින ණය බේරුම් කරන ලදී.

(15) ඉහත සිද්ධියෙහි සඳහන් වට්ටම, සියරට සළුපිළි ව්‍යාපාරයට,

1. වෙළෙඳ වට්ටම්වලට අදාළ දුන් වට්ටමකි.
2. වෙළෙඳ වට්ටම්වලට අදාළ ලද වට්ටමකි.
3. මුදල් වට්ටම්වලට අදාළ දුන් වට්ටමකි.
4. මුදල් වට්ටම්වලට අදාළ ලද වට්ටමකි.

(16) ඉහත සිද්ධියෙහි සඳහන් වට්ටම වින්ඩ් ටෙක්ස්ටයිල් ආයතනයට,

1. වෙළෙඳ වට්ටම්වලට අදාළ දුන් වට්ටමකි.
2. වෙළෙඳ වට්ටම්වලට අදාළ ලද වට්ටමකි.
3. මුදල් වට්ටම්වලට අදාළ දුන් වට්ටමකි.
4. මුදල් වට්ටම්වලට අදාළ ලද වට්ටමකි.

(17) වට්ටම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1. දුන් වට්ටම් හා ලද වට්ටම් දක්නට ලැබෙන්නේ මුදල් වට්ටම් තුළ පමණි.

2. වෙළෙඳ වට්ටම් හා මුදල් වට්ටම් යන දෙවර්ගයම ගිණුම්වල සටහන් කරයි.

3. ඉඩදුන් කාලය තුළ ණයගැතියන්ගේ මුදල් ලැබීමේදී ලැබිය යුතු ණය වටිනාකමින් කරන අඩු කිරීම දුන් මුදල් වට්ටමකි.

4. ඉක්මනින් ණය බේරුම් කිරීමට ගැණුම්කරු පෙළඹවීම සඳහා වෙළෙඳ වට්ටම් ලබාදේ.

❖ ලකුණු කළ මිල රු. 50 000 ක භාණ්ඩ තොගයක් භාතිය විසින් ණයට ගන්නා ලදී. එහිදී ඔහුට 10% වට්ටමක් ලැබුණි. මසකට පසුව මුදල් ගෙවීමේදී 5% ක මුදල් වට්ටමක් ද හිමිවිය.

(18) ඉහත සිද්ධියේ සඳහන් වෙළෙඳ වට්ටමේ අගය වනුයේ,

1. රු. 500
2. රු. 250
3. රු. 5 000
4. රු. 2 500

(19) ඉහත සිද්ධියේ සඳහන් මුදල් වට්ටමේ අගය වනුයේ,

1. රු. 2 500
2. රු. 2 250
3. රු. 4 750
4. රු. 5 000

(20) භාතිය විසින් ගෙවූ මුදල සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. ණයහිමි ගිණුම හර රු.50 000
   මුදල් ගිණුම බැර රු.50 000

2. ණයහිමි ගිණුම හර රු. 45 000
   මුදල් ගිණුම බැර රු. 45 000

3. ණයහිමි ගිණුම හර රු. 45 000
   මුදල් ගිණුම බැර රු. 42 750
   ලද වට්ටම් ගිණුම බැර රු. 2 250

4. ණයහිමි ගිණුම හර රු. 50 000
   මුදල් ගිණුම බැර රු. 45 000
   ලද වට්ටම් ගිණුම බැර රු. 5 000

(21) කසුන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.

| | |
|---|---|
| ණයහිමි ගිණුම හර | රු.50 000 |
| මුදල් ගිණුම බැර | රු.45 000 |
| ලද වට්ටම් ගිණුම බැර | රු. 5 000 |

ඉහත ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව වන්නේ,

1. ණයහිමියාට රු. 45 000 ක් මුදලින්ද, රු. 5 000 ක් මුදලින් වට්ටම් ලෙසද ගෙවීම.
2. රු. 50 000 ක භාණ්ඩ ණයට ගැනීමේදී 10% ක වෙළෙඳ වට්ටමක් ලැබීම.
3. රු. 50 000 ක ණයහිමි ගිණුම පියවීමේදී රු. 5 000 ක මුදල් වට්ටමක් හිමිවීම.
4. රු. 45 000 ක් ගෙවිය යුතු ණයහිමියෙකුට වැරදීමකින් රු. 50 000 ක් ගෙවීම.

(22) සමන්ගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ. එම ගනුදෙනු මුදල් පොතට "හර" වන්නේද "බැර" වන්නේද යන්න පහත සඳහන් වගුවෙහි (✓) ලකුණ යොදා සටහන් කරන්න.

| | හර වේ | බැර වේ. |
|---|---|---|
| 1. සමන් අතිරේක ප්‍රාග්ධනය යෙදුවා රු. 50 000 යි. | | |
| 2. බැංකු ණය ආපසු ගෙව්වා රු. 20 000 යි. | | |
| 3. භාණ්ඩ තොගයක් අත්පිට මුදලට වික්කා රු. 1 000 යි. | | |
| 4. ණයගැතියෙකුගෙන් මුදල් ලැබුණා රු. 30 000 | | |
| 5. යන්ත්‍රයක් මිලට ගත්තා රු. 85 000 යි. | | |
| 6. ගොඩනැගිලි කුලී ආදායම ලැබුණා රු. 10 000 | | |
| 7. සමන් රු. 5 000 ක් තම පෞද්ගලික කටයුත්තක් සඳහා ලබාගත්තා. | | |
| 8. ණයහිමියෙකු වූ පියල්ට ගෙව්වා රු. 2 000 | | |
| 9. විදුලිය බිල ගෙව්වා රු. 1 500 යි. | | |
| 10. බැංකු ණයක් නැවත ලබාගත්තා රු. 50 000 | | |

(23) පහත දැක්වෙන්නේ ශාක්‍යාගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනුය.

| දිනය | වවුචරය/ ලදුපත් අංකය | ගනුදෙනුව |
|---|---|---|
| 2021.01.01 | 001 | රු. 50 000 ක භාණ්ඩ තොග මිලට ගත්තා. |
| 2021.01.02 | 001 | රු. 25 000 ක භාණ්ඩ තොග අත්පිට මුදලට වික්කා. |
| 2021.01.05 | 002 | ණයගැතියෙකු වූ සනුකගෙන් මුදල් ලැබුණා. රු. 10 000 |
| 2021.01.07 | 003 | රු. 2 000 ක පොළී ආදායම ලැබුණා. |
| 2021.01.10 | 002 | යන්ත්‍ර අලුත්වැඩියා වියදම රු. 5 000 යි. |
| 2021.01.12 | 003 | ණයහිමි කසුන්ට මුදල් ගෙව්වා රු. 10 000යි. |
| 2021.01.15 | 004 | ශාක්‍යාගේ නිවසේ විදුලිබිල ගෙව්වා රු. 2 500 යි. |
| 2021.01.16 | 004 | බැංකු ණයක් ගත්තා රු. 80 000 යි. |
| 2021.01.18 | 005 | ශාක්‍යා අමතර ප්‍රාග්ධනය යෙදුවා රු. 50 000 යි. |
| 2021.01.25 | 005 | යන්ත්‍රයක් මිලට ගත්තා රු. 10 000 යි. |

ඉහත ගනුදෙනු මුදල් පොත සහ අදාළ ලෙජර ගිණුම්වල සටහන් කර එම ගිණුම් තුලනය කර දක්වන්න.

(24) නෙතුකිගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මස 01 වන දිනට පැවති ශේෂයන් පහත දැක්වේ.

මුදල් ශේෂය රු. 40 000
ප්‍රාග්ධන ශේෂය රු. 55 000

<u>ණයගැතියෝ</u>
කුසල් රු. 16 000
මනීෂා රු. 20 000

<u>ණය හිමියෝ</u>
අභීත රු. 18 000
යොහාන් රු. 15 000

ජනවාරි මාසය තුළදී සිදුවූ ගනුදෙනු පහත පරිදි වේ.

2021.01.02 - අත්පිට විකුණුම් සඳහා රු. 30 000 ක චෙක්පතක් ලැබුණි.
2021.01.06 - අත්පිට ගැනුම් රු. 19 000
2021.01.15 - අභීතගේ ණය පියවීමේදී රු. 3 000ක වට්ටමක් ලැබුණි.
2021.01.20 - මනීෂාගෙන් ලැබිය යුතු මුදල් සියල්ල ලද අතර එහිදී 10 % ක වට්ටමක් ඇයට හිමිවිය.
2021.01.24 - කුසල්ගෙන් රු. 5 000 ක මුදලක් ලද අතර, අඩුකළ වට්ටම රු. 1 000 කි.
2021.01.26 - යොහාන්ට රු. 10 000 ක ණය ගෙවීමේදී 10 % ක වට්ටමක් ලැබුණි.

ඉහත ගනුදෙනු වට්ටම් තීරු සහිත මුදල් පොතේ හා අදාළ ලෙජර ගිණුම්වල දක්වා තුලනය කර පෙන්වන්න.

(25) ව්‍යාපාරයක නිතර නිතර සිදුවන අඩු වටිනාකම් සහිත ගෙවීම් සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛණය හා මූලික සටහන් පොත වන්නේ,

(1) ගෙවීම් වවුචරය හා මුදල් පොත
(2) ලදුපත හා සුළු මුදල් පොත
(3) සුළු මුදල් ගෙවීම් වවුචරය හා සුළු මුදල් පොත
(4) ජර්නල වවුචරය හා මුදල් පොත

(26) කාලච්ඡේදය අවසානයේ වියදම් කළ මුදලට සමාන මුදලක් ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට නැවත ලබාදීම හඳුන්වනුයේ,

(1) සුළු මුදල් අග්‍රිමය ලබාදීම ලෙසය.
(2) සුළු මුදල් ගෙවීම් සිදු කිරීම ලෙසය.
(3) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම ලෙසය.
(4) සුළු මුදල් වෙන් කිරීම ලෙසය.

(27) සුළු මුදල් පොතක වෙනත් ලෙජර ගිණුම් තීරුවේ සටහන් කලයුතු අයිතම පමණක් ඇති පිළිතුර වනුයේ,

(1) මුද්දර ගාස්තු, ලියුම් කවර මිලට ගැනීම, ණයහිමි කැළුම්ට ගෙවීම්
(2) ගමන් වියදම්, ගෙන ඒමේ කුලී, සිසිල් බීම සඳහා ගෙවීම.
(3) ණයහිමි කැළුම්ට ගෙවීම, ගෙනඒමේ කුලී, පරිගණක යතුරු පුවරුවක් මිලට ගැනීම.
(4) පිරිසිදු කාරක ද්‍රව්‍ය මිලට ගැනුම්, ත්‍රී රෝද රථ ගාස්තු, බස් ගාස්තු

(28) සුළු මුදල් පොත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) සුළු මුදල් පොතේ හර සහ බැර ලෙස පැති දෙකක් දක්නට නොමැත.
(2) මුදල් පොත මෙන් සුළු මුදල් පොත ද ද්විත්ව කාර්යයක් ඉටු කරනු ලබයි.
(3) වියදම් ගිණුම් පිළිබඳ ද්විත්ව සටහන් රීතියට අනුව සුළු මුදල් පොතේ සටහන් තැබීම සිදු කරයි.
(4) සුළු මුදල් භාරකරුට අග්‍රිමය ලැබෙන විට මුදල් පොත හර කර සුළු මුදල් පොත බැර කළ යුතුය.

පහත තොරතුරු ඇසුරින් 30 – 33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. සීමිත බැලේ සමාගම සුළු වියදම් ගෙවීම සඳහා සුළු මුදල් පොතක් පවත්වාගෙන යයි.

එම සමාගමේ 2021 ජනවාරි මස සුළු මුදල් ගනුදෙනු සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2021.01.01 | ශේෂය | රු. 400 |
| 2021.01.01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | රු. 2 600 |
| 2021.01.31 | අත ඉතිරි ශේෂය | රු. 500 |

(29) බැලේ සමාගමේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කීයද ?

(1) රු. 2 600 (2) රු. 3 000
(3) රු. 3 100 (4) රු. 3 500

(30) බැලේ සමාගමේ ජනවාරි මාසයේ සුළු මුදල් වියදම කීයද?

(1) රු. 2 200 (2) රු. 2 500
(3) රු. 2 600 (4) රු. 3 500

(31) 2021.01.31 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් ප්‍රතිපූරණය සඳහා ලබාදිය යුතු මුදල කොපමණද?

(1) රු. 2 100 (2) රු. 2 200
(3) රු. 2 500 (4) රු. 2 600

(32) බැලේ සමාගම පෙබරවාරි මුල සිට සුළු මුදල් අග්‍රිමය තවත් රු. 500 කින් වැඩි කිරීමට තීරණය කලේ නම් ප්‍රතිපූරණය සඳහා ලබාදිය යුතු මුදල් වන්නේ,

(1) රු. 2 000 (2) රු. 2 500
(3) රු. 3 000 (4) රු. 3 500

(33) සිතුමිගේ ව්‍යාපාරයේ සුළු මුදල් වලට අදාල තොරතුරු පහත වේ.

- සුළු මුදල් අග්‍රිමය රු.3000ක් වන අතර සෑම මසක් අවසානයේම අග්‍රිමය ප්‍රතිපූර්ණය කෙරේ.
- 2021.10.01 දිනට ශේෂය රු.800කි.

ඔක්තෝබර් මාසයේ සුළු මුදල් ගෙවීම් පහතවේ.

| | | |
|---|---|---|
| 10/1 | - | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා. |
| 10/2 | - | ලිපි ද්‍රව්‍ය මිලට ගත්තා. රු.80 |
| 10/5 | - | ත්‍රිවිල් කුලිය රු.150 |
| 10/7 | - | පෑන් හා පැන්සල් මිලට ගත්තා රු.100 |
| 10/10 | - | සුනිල්ට ගෙවූ මුදල රු.500 |
| 10/12 | - | ගමන් ගාස්තු ගෙවූවා.රු.75 |
| 10/15 | - | ගෙන ඒමේ කුලී රු.200 |
| 10/20 | - | හාෆ් ෂීට් මිලට ගැනීම්. රු.400 |
| 10/25 | - | සංග්‍රහ වියදම් රු.350 |
| 10/28 | - | බස් ගාස්තු රු.150 |
| 10/30 | - | උපකරණ මිලට ගැනීම් රු.600 |
| 10/31 | - | අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා. |

ලිපි ද්‍රව්‍ය, ගමන්, විවිධ හා ලෙජර ගිණුම් ඇතුළත් කර සුළු මුදල් පොත පිළියෙල කරන්න.